ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි . විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 25 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය,මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. .

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති 06/2024 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 6 ඡේදයට අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන ඍජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කලයුතු වූවත් දෙපාර්තමේන්තුව විසින් මුදලින් ලද අත්තිකාරම් ලැබීම් සහ මුදලින් කල අත්තිකාරම් ගෙවීම් පමණක් සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර තිබුණි. ඒ අනුව, අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් රු.1,074,913 ක් බැගින් අඩුවෙන් දක්වා තිබූ අතර එම හේතුවෙන්, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	සමස්ත මුදල් ප්‍රවාහය සඳහා මෙමඟින් බලපෑමක් සිදු නොවේ.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතු වීම.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඵලදායි රාජ්‍ය ආයෝජන කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතියේ Completion of Milestone of Information System for Project Proposals සඳහා ගිවිසුම් ප්‍රකාරව කාර්යය නිම කිරීම සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමකින් තොරව, 2024 දෙසැම්බර් 19 දිනැති ප්‍රධාන උපදේශකගේ අභ්‍යන්තර මෙමෝ පත්‍රිකාව හා අදාල ආයතනයේ ඉන්වොයිසිය පදනම් කරගෙන රු.1,454,011 ක් ගෙවීම සිදු කර ඇති ආකාරයට චෙක්පතක් ලියා තිබුණි.	ඵලදායි රාජ්‍ය ආයෝජන කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධන ව්‍යාපාතියේ කාර්ය සම්පූර්ණයෙන් නිම වී ඇති ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2024 දෙසැම්බර් 13 වන දිනැති ලිපිය මඟින් තහවුරුවක් ලබා දී ඇති අතර, එම ව්‍යාපෘතියේ ගෙවීම් කිරීමේ ගොණුවල	වර්ෂයට අදාළ වියදම් හා වත්කම් පමණක් ගිණුම්ගත කළ යුතු වීම හා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව වර්ෂය අවසානයේ මුදල් රඳවා තබා නොගත යුතු වීම.

අනතුරුව, ප්‍රධාන උපදේශක විසින් කාර්යය නිම වී නොමැති බැවින් ගෙවීම තාවකාලිකව නවතා තබන ලෙස දන්වා තිබූ අතර, 2024 දෙසැම්බර් හා 2025 ජනවාරි මස බැංකු සැසඳුම් විස්තරය අනුව මෙම චෙක්පත නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පතක් ලෙස දක්වා තිබුණද, එම චෙක්පත අදාල ආයතනයට නිකුත් කිරීමකින් තොරව 2025 පෙබරවාරි මස 13 දින තෙක් රඳවාගෙන තිබුණි. ඒ අනුව, සත්‍ය වශයෙන් නොදරන ලද රු.1,454,011 ක් හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වියදම හා මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.	ප්‍රමාදයක් නිසා ගෙවීම් තාවකාලිකව නවත්වන ලෙස අභ්‍යන්තර මැමෝ පත්‍රිකාව මඟින් දක්වා ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ මෙම මෘදුකාංගය සඳහා යන වියදම් 2024 වර්ෂයේ ඇස්තමේන්තුව මඟින් සලසා ගෙන ඇති අතර. එහි කාර්යය 2024 වර්ෂයේ දෙසැම්බර් මස දී නිමවීමෙන් අනතුරුව මුදල් රෙගුලාසි 135 බලතල ප්‍රකාරව ගෙවීම් සිදු කර ඇත. ශ්‍රී ලංකා රජය හා ඉහත ආයතනය අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව සිදු කල යුතු ගෙවීමක් වන අතර සත්‍ය වශයෙන් සිදු වුන ගෙවීමකි.	

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුනරාවර්තන වැය විෂයයන් තුනක් හා මූලධන වැය විෂයයන් පහකට අදාල ඇස්තමේන්තුගත ප්‍රතිපාදන එකතුව රු.10,850,000 න් රු.8,085,573 ඉතිරිව තිබූ අතර එම ඉතිරිය සියයට 33 ත් සියයට 100 ත් අතර පරාසයක් ගෙන තිබුණි.	වියදම් පාලනය කිරීමත්, අළුත්වැඩියාවන් සිදු නොවීමත්, යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා ගිවිසුම් සඳහා කරන ලද වියදම හා වාහන රක්ෂණය සඳහා වියදම් අඩු වීමත්, පාඨමාලා හැදෑරීම හා දේශීය පුහුණුවීම්වලට යොමු වීම සීමා වීම, පසුගිය වසර අවසාන භාගයේ දේශීය පුහුණුවීම්	ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතු වීම.

	පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය එයට මූල්‍ය සහයෝගය දැක්වීම හා එකී වැඩමුළුව 2025 වසර මුලදී සිදු කිරීමට කටයුතු කිරීම, කාර්යාල උපකරණ හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර නොගැනීම, ගොඩනැගිලි සහ ඉදිකිරීම් සිදුනොවීම හා වාහන භාවිතය අවම කිරීම හේතුවෙන් වාහන සඳහා වන නඩත්තු කටයුතු සිදු නොවීම, යනාදී හේතුන් නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1. **සැලසුම් කිරීම**

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කළ යුතු වගකීම් ක්ෂේත්‍රය හා ක්‍රියාකාරකම් දක්වා තිබුණ ද, ඒ සඳහා වගකිවයුතු නිලධාරියා පිළිබඳව සඳහන් කර නොතිබුණි. මාර්ගෝපදේශයේ 3 (ඊ) ඡේදය ප්‍රකාරව, ක්‍රියාකාරී සැලැස්ම තුළ අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කළ යුතු වගකීම්, ක්ෂේත්‍ර හා ක්‍රියාකාරකම් දක්වා තිබුන ද අතපසු වීමකින් ඒ සඳහා වගකිවයුතු නිලධාරීන් පිළිබඳව සඳහන් කර නොතිබුනි. එහෙත් එය 2025 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම මඟින් නිවැරදි කර ඇත.	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම.

4.2 **විදේශ ආධාර ව්‍යාපෘති**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූලික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොගෙන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසංවිධාන හදිසි ආධාර ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකාවේ වෙළඳපල සංධානය (PALAM/A) යන	ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසංවිධාන හදිසි ආධාර ව්‍යාපෘතියේ වැය විෂයන් 04ක් සඳහා මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන මාරු කර ඇති බවත්, ශ්‍රී	නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු

	ව්‍යාපෘති 02ක යටතේ වැය විෂයයන් 06ක් සඳහා එකතුව රු.2,330,064,097ක් සමාලෝචිත වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ 66 මඟින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.	ලංකාවේ වෙළඳපල සංධානය වීම. අදිරය II ව්‍යාපෘතිය සඳහා කැබිනට් අනුමැතිය 2024 වර්ෂයේ පෙබරවාරි මස ලද බැවින් එම ව්‍යාපෘතියට අදාළ ප්‍රතිපාදන අවශ්‍යතාව පරිපූරක ඇස්තමේන්තුව හා මු.රේ 66 මඟින් සලසා ගෙන ඇත.	
(ආ)	දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා මූල්‍ය අංශ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (ඕස්ට්‍රේලියානු ප්‍රදානය), වෙළඳාමේ ජාතික ආදායම්, වියදම් ක්‍රියාකාරකම්වල ඉක්මන් ප්‍රතිඵල සඳහා සහයෝගීතාවය පිළිබඳ ව්‍යාපෘතිය සහ ඵලදායි රාජ්‍ය ආයෝජන කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධනය යන ව්‍යාපෘතීන් හතර සඳහා වෙන් කරන ලද, ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවල එකතුව රු.2,967,780,000 කින් එකතුව රු.2,282,783,809 ක් එම ව්‍යාපෘතිවල වැය විෂයයන් සඳහා භාවිතයට නොගෙන වෙනත් වැය විෂයයන් සඳහා මු.රෙ 66 මඟින් මාරු කර තිබුණි. එම මාරු කරන ලද වටිනාකම වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 08ක සිට සියයට 100ක පරාසයක පැවතුණි.	**ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසංවිධාන හදිසි ආධාර ව්‍යාපෘතිය.** ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුවෙන් රු 75,018,761 ක මුදලක් පමණක් ශ්‍රී ලංකාවේ වෙළඳපල සංවිධානය ව්‍යාපෘතියට මාරු කර ඇති අතර ඉතිරි ප්‍රතිපාදන මාරු කිරීම් ආහාර සුරක්ෂිතාව සහ ජීවනෝපාය ප්‍රතිසංවිධානය හදිසි ආධාර ව්‍යාපෘතිය ඇතුලතම මාරු කර ඇත. **ශ්‍රී ලංකා මූල්‍ය අංශ ආරක්ෂණ ජල ව්‍යාපෘති (ඕස්ට්‍රේලියානු ප්‍රදානය)** ව්‍යාපෘතිය යටතේ විදේශ ප්‍රධාන (13) මූලාශ්‍ර යටතේ ලබාදුන් ප්‍රතිපාදන වලින් රු. 700,000,000 ක ඉතිරි ප්‍රතිපාදන ශ්‍රී ලංකාවේ වෙළඳපල සංවිධානය ව්‍යාපෘතියට මාරු කල අතර, එම ව්‍යාපෘතියේ විදේශ මූල්‍යකරණය ආශ්‍රීත පිරිවැය (17) යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රු. 45,120,960 ක ප්‍රතිපාදන වෙළඳාමේ ජාතික ආදායම්, වියදම් ක්‍රියාකාරකම්වල ඉක්මන් ප්‍රතිඵල සහයෝගිතා ව්‍යාපෘතියට හා රු.4,879,040 ක ප්‍රතිපාදන ශ්‍රී ලංකාවේ වෙළඳපල සංවිධාන ව්‍යාපෘතියට මාරු කර ඇත.	-එම-

		වෙළඳාමේ ජාතික ආදායම්, වියදම් ක්‍රියාකාරකම්වල ඉක්මනින් ප්‍රතිඵල සහයෝගීතාවය (Partner) ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද රු. 5,000,000 ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රදාන මූළු උපකරණ මූලාශ්‍රය (13) යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන සඳහා මාරු කරන ලදී. **ඵලදායි රාජ්‍ය ආයෝජන කළමණාකරණය සඳහා ධාරිතා සංවර්ධනය** ව්‍යාපෘතියේ ප්‍රයෝජනයට නොගත් ඉතිරි ප්‍රතිපාදන අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතා ඇති ව්‍යාපෘතියක් වූ ශ්‍රී ලංකාවේ වෙළඳපල සංධානය (**PALAM/A)** ව්‍යාපෘතියට මාරු කරන බවද, ප්‍රතිපාදනය භාවිතයට නොගෙන ඉතිරි වන ප්‍රතිපාදන අවශ්‍යතාවයන් ඇති ව්‍යාපෘතීන් සඳහා මු.රේ 66 ප්‍රකාරව මාරු කිරීමෙන් අතිරේක ප්‍රතිපාදන කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.	
(ඇ)	ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ මූලධන වැය විෂයයන් 03කට අදාලව එකතුව රු.1,870,000,000ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් මු.රෙ 66 මඟින් වෙනත් වැය විෂයයකට ප්‍රතිපාදන මාරු කල පසුද, එකතුව රු.369,188,319 ක් ඉතිරි වී තිබුණි. එය එම වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 83 සිට 98 දක්වා පරාසයක පැවති අතර, ඉහත ව්‍යාපෘතිය යටතේ 237-1-1-20-2202-13 හා 237-1-1-20-2202-17 (සංවර්ධන සහායන්) යන මූලධන වැය විෂයයන් 2 සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ එකතුව රු.420,000,000 න් එකතුව රු.197,695,768 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතුරු වී තිබුණු අතර ඉතිරිය එම වැය විෂයයන් දෙකෙහි	2024 වර්ෂය තුල පවත්වන ලද ජනාධිපති මැතිවරණය හා මහ මැතිවරණය නිසා මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සැලසුම් කල පරිදි සිදු නොවීම හේතුකොටගෙන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	- එම -

ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 45 ක් හා සියයට 95 ක්ව පැවතුණි. ඒ අනුව, අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම නිසා ඉතිරි වී ඇති බවත්, එම නිසා රටේ වෙනත් වැදගත් දෙයකට මුදල් යෙදවීමට නොහැකි වී ඇති බවත්, විගණනයේදී නිරීක්ෂණය විය.

4.3 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව ලියාපදිංචිය, සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම ආදී කටයුතු, සියලු රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේදී අවස්ථා 8 ක දී එකතුව රු.2,751,980 ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමෙන් තොරව මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.	2024 මුල් මාස කිහිපය තුල සිදු කරන ලද සියළුම ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදනයෙන් තොරව සිදුකරන ලද අතර, Toner වර්ග හා Cartilage වර්ග මිලදී ගැනීමේ දී ඒ ඒ වෙළඳ සන්නාම වලට අදාල යන්ත්‍ර සේවා සපයන බලපත්‍රලාභි ආයතන ලංකාව තුළ පවතින අතර එම සන්නාමයන්හි මාදිලි සඳහා අවශ්‍ය උපාංග එම ආයතන හතරෙන්ම මිලදී ගැනිම සිදුකල යුතුය. එවැනි අවස්ථාවලදී විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා යොමු කිරිම නිෂ්ඵල ක්‍රියාවක් බැවින් එසේ යොමු කිරිම සිදු නොකරන ලදි.	ප්‍රසම්පාදනයන් සිදු කිරිමේදි අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

4.4 වත්කම් කළමනාකරණය

4.4.1 වාහන අලාභහානි

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වාහන 3 කට අදාල අනතුරු පිළිබඳව මුදල් රෙගුලාසි 104 (1) (අ) සහ 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව නිකුත් කිරීමට දින 40 ත් දින 150 ත් අතර කාලයක් ගෙන තිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණයෙන් පසු අලාභ හානිය සිදු වූ දිනයේ සිට මාස 03ක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, එක් වාහන අනතුරකට අදාලව පූර්ණ වාර්තාවක් මේ දක්වා ඉදිරිපත් කර නොතිබූ අතර මේ පිළිබඳව මූලික පරීක්ෂණයක් හෝ පවත්වා නොතිබූ අතර අනෙක් වාහන අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට මාස 6ක කාලයක් ගෙන තිබුණි. තවද, දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශයට තාවකාලික පරිහරණය සඳහා භාරදී තිබූ තවත් වාහනයක් අනතුරකට ලක්විමට අදාලව මුදල් රෙගුලාසි 1642 ප්‍රකාරව පොලීසියට අප්‍රමාදව වාර්තා කර නොතිබූ අතර රියදුරු විසින් අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීමක් කර තිබූ බවට විගණනයේදී තහවුරු නොවීය. මෙම අනතුර සිදුවී මාස 09 කට අධික කාලයට පසු මූලික පරීක්ෂණ පැවැත්වීමට පත්කර තිබූ පරීක්ෂණ මණ්ඩලය විසින් 2024 නොවැම්බර් 29 දින මු.රෙ 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාවක් නිකුත් කර තිබුණ ද, එම පරීක්ෂණය මඟින් නිසි පරිදි අනතුරට අදාල කරුණු අනාවරණය වී නොමැති බවට අභ්‍යන්තර විගණනය විසින් අනාවරණය කර තිබූ බවත්, ඒ අනුව මෙම අනතුර සිදු වී මාස 19 කට අධික කාලයක් ගත වි ඇතත් පරීක්ෂණ කටයුතු අවසන්වී නොමැති බව නිරීක්ෂණය විය.	මෙම වාහන අතරින් එක් වාහනයක් මුදල් අමාත්‍යාංශයට අයත් බැවින් එහි අනතුරට අදාළ මු.රෙ 104 ප්‍රාරම්භක වාර්තාව මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති අතර අවසන් වාර්ථාව ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කරන ලදී. අනෙක් වාහන අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට මාස 6ක කාලයක් ගෙන තිබූ බැවින් විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. මෙම දෙපාර්තමේන්තුවට අයත් අනෙක් වාහනය තාවකාලිකව මුදල් අමාත්‍යාංශය වෙත භාර දී තිබූ අවස්ථාවේදී අනතුරට ලක්වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වූ කරුණු මත පරීක්ෂණයන් සිදු කර ඇත. නැවත විධිමත් පරිදි පරීක්ෂණය සිදු කිරීම සඳහා වෙනත් දෙපාර්තමේන්තුවකින් නිලධාරියෙක් නම් කර ගැනීම සඳහා 2025.04.23 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

5. තිරසර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
එක්සත් ජාතීන්ගේ 2030 වර්ෂය දක්වා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම හා ඒවාට ළඟාවීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්නායක හඳුනාගැනීම හා ඊට අදාල නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය නොවීය.	තිරසර සංවර්ධන අරමුණු 04 ක් සහ ඊට අදාළ නිර්නායක හඳුනාගෙන ඇත.	තිරසර සංවර්ධන අරමුණු හා නිර්නායක හඳුනාගෙන ඇති බව සඳහන් කර තිබුණ ද 2024 කාර්ය සාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවට අදාලව තිරසර සංවර්ධන අරමුණු වෙනම හඳුනා ගැනීමක් සිදු කරනු නොලබන බව දක්වා තිබුණි. තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයේ සඳහන් පරිදි සිය විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු/ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණනයට ඉදිරිපත්කල තොරතුරු අනුව 2024 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තත්‍ය සේවක සංඛ්‍යාව 42 තුළ, රා.ප.චක්‍ර 14/2022 අනුව වසර 5 ක විදේශ නිවාඩු ලබා ගත් නිලධාරීන් දෙදෙනෙක්, සේවය හැරගියා සේ සලකනු ලබන	පසු ගිය වසරේ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 17 ක් පැවැති අතර ඒ සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට එකඟතාවය පළ කර ලිපි ඉදිරිපත් කරනු ලැබුවත්, අනුප්‍රාප්තිකයෙකු නොමැතිව සේවය කරන	කඩිනමින් අවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම.

නිලධාරීන් එක් අයෙක් සහ විධිමත් අනුමැතියකින් තොරව වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාගත් නිලධාරියෙකුද ඇතුළත්ව තිබුණි. ඒ අනුව, සක්‍රීය සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවක සංඛ්‍යාව 38 ක් විය. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 21 ක් (පුරප්පාඩුව 17 සහිතව) හෙවත් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 35 කගේ දායකත්වය ලබාගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය කෙරේ. එසේ වුවද, කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු ඇතුලු පුරප්පාඩු පුරවා ගැනීමට හෝ අවශ්‍යතාවය අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වා විධිමත් පියවර ගෙන නොතිබිණ.

ආයතනයෙන් නිදහස් කර ගත නොහැකි වීමත්, මැතිවරණ කාලවකවානු වැනි විවිධ හේතුන් මත එම නිලධාරින්හට ස්ථාන මාරු වීමට නොහැකි විමත්, එම නිලධාරීන් කිහිප දෙනෙක් මෙම වර්ෂයේ දී රාජකාරියට වාර්තා කිරිම සිදු විය.

අවසාන වරට අනුමත කාර්ය මණ්ඩලයේ පුස්තකාලයාධිපති තනතුර I/II/III ශ්‍රේණියේ තනතුරක් ලෙස අනුමත කර ඇතත් වසර ගණනාවක් පුරප්පාඩුව තිබූ මෙම තනතුරට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ස්ථාන මාරු කර එවා තිබුණේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි. එම නිසා තෘතියික මට්ටමේ තත්‍ය සේවක සංඛ්‍යාවේ අතිරික්ත නිලධාරියෙකු සිටියි. පුස්තකාලයාධිපති තනතුර විශේෂ ශ්‍රේණියේ තනතුරක් ලෙස අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.